Nestlé Good food, Good life

# මාධ්‍ය නිවේදනය

කොළඹ, 2022, නොවැම්බර් 17

## නෙස්ලේ මයිලෝ ශ්‍රී ලංකාවේ අනාගත දැල්පන්දු තාරකා බිහිකිරීමට උරදෙයි

- 29 වැනි ශ්‍රී ලංකා පාසල් දැල්පන්දු ශූරතාවලියට අනුග්‍රාහකත්වය

අඛණ්ඩව 29 වැනි වරටත් ශ්‍රී ලංකා පාසල් දැල්පන්දු සංගමය සංවිධානය කරනු ලබන 2022 ශ්‍රී ලංකා පාසල් දැල්පන්දු ශූරතාවලිය සඳහා නෙස්ලේ මයිලෝ අනුග්‍රාහකත්වය ලබාදුනි. දැල්පන්දු ක්‍රීඩාව ආශ්‍රිත පාසල් දින දර්ශනය තුළ වැදගත්ම තරගාවලියක් වන මෙම ශූරතාවලිය සංවිධානය කරනු ලබන්නේ අධ්‍යාපන අමාත්‍යංශයේ මාර්ගෝපදේශකත්වය යටතේ ය. මෙම ශූරතාවලිය හරහා 15,000කට අධික අනාගත දැල්පන්දු තාරකාවන්ට තම කුසලතා ජාතික තලයේ පෙන්නුම් කිරීමේ අවස්ථාව උදාවිය. නොවැම්බර් 11, 12 සහ 13 යන තෙදින තුළ වෙන්නප්පුවේ පැවැති එහි අවසන් තරගවලදී, කුරුණෑගල ශුද්ධ වූ පවුලේ කන්‍යාරාමය සමස්ත ශූරතාවලිය දිනාගැනීමට සමත්වූ අතර, ඔවුන්ට 13 වැනි වරට මයිලෝ කුසලාන ශූරතාව පිරිනැමුණි.

මෙවර ආසියානු දැල්පන්දු කුසලානය දිනාගත් ශ්‍රී ලංකා ජාතික දැල්පන්දු කණ්ඩායම ද මෙම තරගාවලියේ පළමු දින තරග නැරඹීමට එක්ව සිටි අතර, එය පාසල් ක්‍රීඩිකාවන්ට මහත් ධෛර්යයක් විය. ඔවුහු ද අතීතයේ පාසල් දැල්පන්දු ක්‍රීඩිකාවන් ලෙස මයිලෝ කුසලානයට ක්‍රීඩා කළ අතර, පසුකාලීනව ජාතික තලයේ ක්‍රීඩිකාවන් බවට පත්ව ජාත්‍යන්තරය ද ජයග්‍රහණය කළහ. එවන් පසුබිමක, ඔවුන්ගේ පැමිණීම අනාගතයේ ශ්‍රී ලංකාව ජාත්‍යන්තරයේ නියෝජනය කිරීමේ අපේක්ෂාවෙන් පසුවන වර්තමාන පාසල් ක්‍රීඩිකාවන්ට විශාල ශක්තියක් විය.

"නෙස්ලේ මයිලෝ සෑම විටම ශාරීරික ක්‍රියාකාරකම් මෙන්ම ක්‍රීඩාව මගින් අනාගත පරපුරට ඉගැන්විය හැකි වටිනාකම් කෙරෙහි විශාල අවධානයක් යොමුකරනු ලබනවා. එම නිසා, මෙවැනි අනුග්‍රහ දැක්වීම් තුළින් බිම් මට්ටමේ ක්‍රීඩාවන්ට අඛණ්ඩව සහාය වීමට ලැබීමත්, පාසල් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට තම කුසලතා දියුණු කරගැනීමට උපකාර කිරීමට ලැබීමත් අපට විශාල ගෞරවයක්. මෙම ශූරතාවලිය තුළින් අපගේ පාසල් දැල්පන්දු ක්‍රීඩිකාවන්ට තම කුසලතා ඔපමට්ටම් කරගැනීමට මෙන්ම, මෙරට වෙසෙන සෙසු පාසල් දැරියන් තුළත් ක්‍රීඩාවන්හි නියැළීමට උනන්දුවක් ඇති කිරීමටත් හැකිවන බව අපට විශ්වාසයි"

යනුවෙන් නෙස්ලේ ලංකා සමාගමේ උප සභාපති (ආයතන සහ නියාමන සබඳතා) බන්දුල එගොඩගේ මහතා ප්‍රකාශ කළේය.

මෙහිදී වයස අවුරුදු 13 පහළ,15 පහළ, අවුරුදු 17 පහළ සහ අවුරුදු 19 පහළ යන කාණ්ඩ සියල්ලේම ජයග්‍රහණය සනිටුහන් කිරීමට කුරුණෑගල ශුද්ධ වූ පවුලේ කන්‍යාරාමය සමත්වීම කැපී පෙනුණි.

'යහපත් ආහාර, යහපත් ජීවිතයක්' තේමාව කරගත් නෙස්ලේ යනු වසර 115කට වැඩි කාලයක් පුරා ශ්‍රී ලාංකික ජීවිතවලට බද්ධ වූ සමාගමකි. මෙරට වෙළෙඳපොළේ පවතින නෙස්ලේ නිෂ්පාදනවලින් 90%කට වැඩි නිෂ්පාදන ප්‍රමාණයක් කුරුණෑගල පිහිටි නෙස්ලේ කර්මාන්තශාලාවේදී නිෂ්පාදනය කෙරේ. අත්‍යවශ්‍ය විටමින් සහ ඛනිජ ලවණවලින් පරිපූර්ණ nestle මයිලෝ නිපදවනු ලබන්නේ උසස්ම තත්ත්වයේ නැවුම් එළකිරි, මෝල්ට් සාරය සහ හොඳම තත්ත්වයේ කෝකෝවා භාවිත කරමිනි. උසස්ම ප්‍රමිතිය වෙනුවෙන් ලොව පුරා ප්‍රසිද්ධියක් උසුළන නෙස්ලේ සමාගම, එම ප්‍රමිතීන් අනුගමනය කරමින් දේශීය වශයෙන් මයිලෝ නිෂ්පාදනය කරයි.

ඡායාරූපය : ඒ ඒ වයස් කාණ්ඩවලට අදාළව කැපීපෙනෙන දක්ෂතා දැක්වූ ක්‍රීඩිකාවෝ, වමේ සිට දකුණට: වයස අවුරුදු 19 පහළ - ටානියා ගුණසේකර, වයස අවුරුදු 17 පහළ - අකිත්මා අබේසිංහ, වයස අවුරුදු 15 පහළ - නෙතුනි ජයවික්‍රම රෙහාන්සා, වයස අවුරුදු 13 පහළ -තිසුම්ලි විජේරත්න (සියලු ශිෂ්‍යාවෝ කුරුණෑගල ශුද්ධ වූ පවුලේ කන්‍යාරාමයේ ශිෂ්‍යාවෝ වෙති)

---


**Contact:**

| | | | |
|---|---|---|---|
| Corp. Public Affairs | Damitha Kulatunga | +94777915949 | Damitha.Kulatunga@lk.nestle.com |
| Corp. Communications | Isuri Alahakoon | +94760395781 | Isuri.Alahakoon@lk.nestle.com |